# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

අංක 1928/28 හා 2015.08.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියේ සහ අංක 2159/11 හා 2020.01.21 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ 2021.01.01 දිනට අනුමත තනතුරු 4 ක් සඳහා පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ජ්‍යෙෂ්ඨතාවය මත සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2021.04.09 වේ.

02. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනය 2021.01.01 වේ.

03. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

I. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ පළමු (I) ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු (I) ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

III. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පහත සටහනේ සඳහන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් කවර විෂයකට හෝ අයත් විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ බඳවා ගත් විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

IV. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ විධායක සේවා ගණයේ වසර දහ අටකට (18) නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටියට අනුව උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

සටහන : 01. සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ සේවයට ඇතුළත් වූ නිලධාරීන් සඳහා විශේෂ අධ්‍යාපනය, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන ප්‍රතිපත්ති, තෘතියික අධ්‍යාපන කළමනාකරණය, පුස්තකාල හා තොරතුරු අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇගයීම් හා පරීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන් අදාළ විෂය ක්ෂේත්‍රයන් වේ.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නව සේවා ව්‍යවස්ථාව ප්‍රසිද්ධියට පත්කල දිනයට පෙර සම්පූර්ණ කර හෝ අවම වශයෙන් පශ්චාත් උපාධිය සඳහා ලියාපදිංචි වී හෝ ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීමද ඉහත III සුදුසුකම් සපුරාලීම සඳහා සලකා බලනු ලැබේ. එම තොරතුරු සම්මුඛ පරීක්ෂණයේදී විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී විසින් ඉදිරිපත් කළ ලිපියක් මගින් සනාථ කළ යුතුය.මෙම විෂයය

ක්ෂේත්‍රයන් විෂයයක් ලෙස ඇතුළත්වන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම ද උක්ත III සුදුසුකම් සපුරාලීම සඳහා සලකා බලනු ලැබේ.

03. සේවා ව්‍යවස්ථාවේ 10.3.1 හි II හා VI අනුව සම්පූර්ණ කළ යුතු 3 වන කාර්යක්ෂමතා කඩඉම සහ ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව යන සුදුසුකම් නොසලකා මෙම අවස්ථාවට පමණක් විශේෂ ශ්‍රේණියේ උසස්වීම් සිදු කරන අතර, එලෙස විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබන නිලධාරීන්ගේ ඉදිරි වැටුප් වර්ධක ගෙවීම ඔවුන් නියමිත ධාරිතා සංවර්ධන පුහුණුව සම්පූර්ණ කරන තෙක් නතර කිරීමට කටයුතු කරනු ඇත.

04. උසස් කිරීමේ ක්‍රමය:

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව, සේවයේ විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් සිදුකරනු ලැබේ.

II. 2021.01.01 දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙළ අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාවට නොඅඩු නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙක්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරීක්ෂා කරනු ලැබේ.

IV. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරී සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. 2021.01.01 දිනට පවත්නා පුරප්පාඩු සඳහා උසස්වීම් සිදුකරනු ලබන බැවින් එදිනට සුදුසුකම් ලබන නිලධාරීන් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2021.04.09 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ඔබ විසින් ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටින අතර දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද ඉහත දිනට අදාළව උසස්වීම ලැබීමට සුදුසුකම් ලබන දින තෙක් හෝ එදිනට පසු දිනයක් තෙක් සේවයේ යෙදී සිටි සහ උසස්වීමට ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් හට ද මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
2021.03.22